# THE WESTMINISTER MODEL IN SRI LANKA AND ITS CHANGES (Part IV)

# සුළු ජන අයිතිවාසිකම්

සෝල්බරි ව්‍යවස්ථාවෙහි සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් විධි විධාන ගණනාවක් ඇතුළත් විය. ඒවා නම්,

**29(2) වගන්තිය**

සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඇතුළත් කරන ලද ප්‍රබල විධි විධානයක් වූයේ මෙම වගන්තිය යි. ඒ අනුව...

ClassWork.LK

1. ආගමික නිදහස තහනම් කිරීම හෝ සීමා කිරීම හෝ නොකළ යුතු විය.

2. එක් වාර්ගික හෝ ආගමික හෝ ජන කණ්ඩායමක් වෙනත් ජන කණ්ඩායමකට බල නොපාන අවහිරකම්වලට හෝ සීමා කිරීම් වලට හෝ ලක් නොකළ යුතු විය.

3. වාර්ගික හෝ ආගමික හෝ ජන කණ්ඩායමකට වෙනත් එවැනි කණ්ඩායමකට හිමි නැති වරප්‍රසාද ලබා නොදිය යුතු විය.

4. කිසියම් ආගමික මණ්ඩලයක්සංථාපනය එහි පාලකවරයාගෙ අනුමැතිය නොගෙන වෙනස් නොකළ යුතු විය. කිසියම් ආගමික මණ්ඩලයක් නීතිය මඟින් සංස්ථාපනය කර ඇතොත් එහි පාලක මණ්ඩලයේ ඉල්ලීම් මත හැර අන් කිසිදු අයුරකින් වෙනස් කිරීමක් නොකළ යුතු විය.

Class Work.LK

# බහු මන්ත්‍රී ආසන ක්‍රමය

සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පැවති තවත් විධිවිධානයක් වූයේ බහු මන්ත්‍රී ආසන ක්‍රමය යි. මේ මඟින් අපේක්ෂා කළේ දිවයිනේ ඇතැම් ප්‍රදේශවල ප්‍රධාන ජනවර්ගය සමඟ මිශ්‍ර ව ජීවත් වන සුළු ජන කණ්ඩායම්වලට නියෝජනයක් සැපයීම ය.

1946 වසරේ දී පිහිටුවන ලද ඡන්ද කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාව විසින් බදුල්ල, බලංගොඩ, කඩුගන්නාව, අම්බලන්ගොඩ, බලපිටිය සහ මැද කොළඹ යන බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස පිහිටුවන ලදී.

කෙසේ වුව ද සෝල්බරි කොමිසම විසින් බහු මන්ත්‍රී කොට්ඨාස පිහිටුවීම මඟින් අපේක්ෂා කරන ලද අරමුණු, ඒ ආකාරයෙන්ම ඉටු වූයේ නැත.

ClassWork.LK

# නාම කරණයෙන් මන්ත්‍රීවරු සය දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම

මෙම විධිවිධානයෙන් විශේෂයෙන් අපේක්ෂා කෙරුණේ යුරෝපීය,බර්ගර් සහ මුස්ලිම් ජනකොටස් වෙනුවෙන් මන්ත්‍රීවරුන් ස දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම ය. ව්‍යවස්ථාවේ 4(2) වන වගන්තියට අනුව අග්‍රාණ්ඩුකාරයා විසින් මෙම මන්ත්‍රීවරුන් පත් කළ යුතු වූයේ අගමැතිවරයාගේ උපදෙස්වලට අනුකූල ව ය. එබැවින් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් පත් කළ මන්ත්‍රීවරුන්ගෙන් සැබෑ ලෙසින් ම ආරක්ෂා වූයේ නැත.

ClassWork.LK

# සෙනෙට් මණ්ඩලය

සුළු ජන කොටස් සඳහා යම් ආකාරයක රැකවරණයක් සැලසීමේ විධි ක්‍රමයක් ලෙසින් දෙවෙනි මණ්ඩලයක් පිහිටුවීමට විධි විධාන ඇතුළත් කරන ලදි.

සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් අඩක් අග්‍රාණ්ඩුකාරවරයාගෙ අභිමතය පරිදි පත් කිරීමට විධිවිධාන සැලසීම මඟින් සළු ජන කොටස්වල සාමාජිකයන්ට ඔවුන් නියෝජනය කරන සුළු ජන කොටස්වල අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීමට ඉඩ සැලසීම අපේක්ෂාව විය.

අගමැතිවරයා සුළු ජාතික සෙනෙට් සභිකයන් පත් කිරීමේදී ඒ සම්බන්ධයෙන් සුළු ජන පදනම සැලකිල්ලට ගත්ත ද, ඒ සමඟ ම අගමැතිවරයා සහ ඔහුගේ දේශපාලන පක්ෂ කෙරෙහි ඇති දේශපාලන පදනම විශේෂයෙන් සැලකිල්ලට ගත් බව පැහැදිලිව ම පෙනෙන්නට තිබිණි.

මෙහි ප්‍රතිඵලය වූයේ අගමැතිවරයා විසින් පත් කරන ලද සුළු ජන කොටස්වල සෙනෙට් සභිකයන්, අගමැතිවරයා නියෝජනය කළ දේශපාලන පක්ෂවලට ළැදි පිරිසක් වීමය. මෙම තත්ත්වය නිසා ලංකාවේ සෙනෙට් මණ්ඩලය සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රමාණවත් යාන්ත්‍රණයක් ලෙසින් සැලකිය නොහැකි විය.

Classwork.lk

මේ හැර ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවීමෙන් රාජ්‍ය සේවය පිළිබඳ විශ්වාසයක් ඇති කිරීම ව්‍යවස්ථා සම්පාදකයන්ගේ අපේක්ෂාව විය. එමෙන්ම අධිකරණ සේවයේ ස්වාධීනත්වය සඳහා ඇති කළ විධිවිධාන ද සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහය විය.

ClassWork.LK

ClassWork.LK